# ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල

# ඇබෑර්තු

## හදිසි ප්‍රතිකාර ඒකකය (ETU) සඳහා
## හදිසි ප්‍රතිකාර විශේෂඥ වෛද්‍ය තනතුර

**ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සුදුසුකම්** : කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් (PGIM) හදිසි ප්‍රතිකාර ඖෂධ පිළිබඳ MD මණ්ඩල සහතිකකරණය සහිත රජයේ හෝ පෞද්ගලික රෝහල්වල විශේෂඥ වෛද්‍ය නිලධාරීන්.

**වයස** : අයදුම්කරුවන් අවුරුදු 50 නොඉක්මවූ අය විය යුතුය.

**වැටුප් පරිමාණය** : රුපියල් 118,800 – 12 X 3,645 – 162,540/- (මසකට)

එයට අමතරව රාජ්‍ය අංශයට ගෙවනු ලබන දීමනා සහ මණ්ඩලය මගින් අනුමත කළ දීමනාද ගෙවනු ලැබේ.

**සේවයේ යෙදවීමේ නියමයන් :** තනතුර ස්ථිර වන අතර, සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාර අරමුදල් හිමිකම සහිතය.

රාජ්‍ය සේවයේ තනතුරු දරන අයදුම්කරුවන්, තම අයදුම්පත් තමන් සේවය කරන අදාළ ආයතන ප්‍රධානි මාර්ගයෙන් යොමු කළ යුතු අතර, එහි ඍජු පිටපතක්ද යොමු කළ යුතුය. අදාළ ආයතන ප්‍රධානි වෙතින් ලබාගත්, අයදුම්කරු මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යනුවෙන් සඳහන් සහතිකයක් අයදුම්පත සමග අමුණා තිබිය යුතුය.

ශ්‍රී ජයවර්ධනපුර මහරෝහලේ රෝහල් පාලක මණ්ඩලය වෙත, යම් අයකු මෙම තනතුරට පත් කිරීම / නොකිරීම සම්බන්ධව අයිතිය පවතී.

අදාළ අයදුම්පත් බහාලු කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්කරුවන් විසින් තම අයදුම්පත් සම්පූර්ණ ජීව දත්ත ඇතුළත්ව, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ (02) විස්තර සහිතව පහත සඳහන් අය වෙත 2023.06.12 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල,**
**තලපත්පිටිය, නුගේගොඩ.**
**2023 මැයි 24 දින**